'පට්ඨාන' ධර්ම දේශනා මාලාව
'වීථි වාර' – 'ප්‍රකෘති උපනිශ්‍රය ප්‍රත්‍යය'
2019-01-31

නමෝ'තුස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ'තුස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස
නමෝ'තුස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

තුන්ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරිහත් වූ සර්වඥ ධර්ම රාජයාණන් වහන්සේට මේ තුන් ලෝක ධාතුවම කාම රූප අරූප කියන්නාවූ ලෝක ධාතු තුනම ධර්මයෙන් එළිය කරගෙන ධර්මයෙන් ආලෝකමත් කරගෙන ලෝකයට පහළ වී වදාළාවූ ගාම්භීර ධර්ම පණිවිඩයක් ලෝකයට විවර කළාවූ ධර්මයෙන් අනේක සත්වයන්ගේ චිත්ත සන්තානයන් පිබිදෙව්වාවූ ආලෝකමත් කළාවූ එළිය කළාවූ අනන්ත සත්වයන්ට නිර්වාණ ධර්මය කියලා ධර්මයක් තිබෙන බව එයට යා ගන්නට පුළුවන් බව ඒ නිර්වාණ ධාතුවේ උතුම්වූ සැපතක් තිබෙන බව ලෝකයාට හෙළිපෙහෙළි කළාවූ ඒ නිර්වාණ ධාතුවට යා ගන්න ප්‍රතිපත්ති මාර්ගයක්, එළිය තිබෙන මාර්ගයක් පහදා දේශනාකොට වදාළා වූ අනන්ත සත්වයන් ඒ නිර්වාණ ධාතුවට ඇතුල් වෙනවාට පුදුමාකාර ධර්මඡන්දයක් ඇත්තා වූ ධර්මඡන්දයක් කුසලච්ඡන්දයක් පිරි සන්තානයක් දැරුවා වූ සෑම විටම සත්වයන්ගේ සන්තාන දේශනා මාර්ගයෙන් ඒ උතුම් නිර්වාණ ධාතුව පැත්තට හෙරෙව්වාවූ නිවන් මගෙහි ගමන් කරන්නාවූ දෙවියන් මනුස්සයන් බ්‍රහ්මයන් නිරන්තරයෙන්ම උද්යෝගි කර ධර්ම දේශනා පවත්වමින් පිහිට උනාවූ වූ ශාන්ති නායක සම්මා සම්බුදුරජාණන්වහන්සේට මම සිරසින් වැඳ නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

සම්මා සම්බුදු රජාණන්වහන්සේ විසින් පැහැදිලිව පිරිසිදුව නිර්මලව අවබෝධ කොට ගත්තාවූ ඒ උතුම් වූ ධර්ම රත්නයට ලෝකයාට දේශනා කොට වදාළාවූ ධර්ම රත්නයට ප්‍රතිපත්ති වශයෙන් පිහිටා තිබෙන්නාවූ ධර්ම රත්නයට මම නමස්කාර කරනවා, මාගේ නමස්කාරය වේවා!

ඒ ප්‍රණීත වූ ශාන්ත වූ උතුම් වූ නිර්මල ධර්ම මාර්ගයේ සුපටිපන්න ආදී ගුණධාරීව ශාන්තව සුපේසලව වැඩම කොට වදාළාවූ ඒ ධර්ම මාර්ගයේ ගමන්කොට ලොව්තුරා බුදුරජාණන්වහන්සේගේ බුදු නුවණින් ස්පර්ශකොට වදාළ නිර්වාණ ධාතුවට එක්කාසු උනාවූ වැඩම වදාළාවූ නිවනින් සැනසී ගියාවූ අශ්ඨාර්යපුග්ගල මහා සංඝ රත්නයට මම සිරසින් වැඳ නමස්කාරය කරනවා, මාගේ නමස්කාරය වේවා!

අනන්ත ගුණ ඇති බුදුරාජාණන් වහන්සේගේ ආනුභාව බලයෙන් අනන්ත ගුණ ඇති ධර්ම රත්නයේ ආනුභාව බලයෙන් අනන්ත ගුණ ඇති සංඝ රත්නයේ ආනුභාවබලයෙන් බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගුණ ඒක චිත්තක්ෂණික වශයෙන් හෝ වේවා මෙනෙහි කිරීමෙන් නමස්කාර කිරීමෙන් උපදවාගත් කුසල චේතනාවන්ගේ ආනුභාව බලයෙනුත් මේ වචන මාලාවට කන් යොමාගෙන ධර්මය හිතීමේ සකච්ඡා කිරීමේ මනසිකාරය

පෙරදැරිකරගත්ත සිතින් ධර්මය ඇසීමේ බලාපොරොත්තුවෙන් සිටින මේ පින්වතුන් මේ මොහොත දක්වාම සිදුකර ගත්තා වූ නොයෙක් ආකාර පුණ්‍යධර්මයන්ගේ කුසල ධර්මයන්ගේ ආනුභාව බලයෙන් අදත් අපි පින්වත් සැම දෙනාටම කියලා දෙන්න බලාපොරොත්තු වෙන්නාවූ ධර්ම කාණ්ඩය මේ ධර්ම කොට්ඨාසය අභිධර්ම විස්තරය මේ පින්වත් සැම දෙනාටම වැටහේවා. මේ පින්වත් සැම දෙනාටම තේරේවා! මේ පින්වත් සැම දෙනාම ඒ ධර්ම කාණ්ඩය වටහාගෙන තේරුම් අරගෙන උතුම් ධර්ම මාර්ගයේ ගමන් කිරීම් වශයෙන් මේ බණ ඇසීමේ ප්‍රතිපත්තියෙහි යෙදිලා ශ්‍රද්ධාදී ගුණ ධර්ම දියුණු කරගෙන ප්‍රඥාව මොරවාගෙන මේ දහම් ඇසීමේ ප්‍රතිපත්තියෙන් පිළිවෙතින් හිත සමාධි කරගන්නා වූ ප්‍රතිපත්තියෙන් පිළිවෙතින් මෙනෙහි කිරීමේ ප්‍රතිපත්තියෙන් පිළිවෙතින් ගමන්කොට සැමදෙනාටම අමා මහා නිවනින් සැනසෙන්න ලැබේවා කියලා මෛත්‍රීයෙන් ආශිර්වාද කරනවා. ප්‍රාර්ථනා කරනවා.

එසේ ප්‍රාර්ථනා කරමින් මේ පින්වතුන්ට මම තව ධර්ම කාණ්ඩයක් කියලා දෙනවා එදිනෙදා ජීවිතියට යොදාගෙන බලන්න පුළුවන් ආකාරයේ පැත්තකට හැරිලා. මීට පෙර අවස්ථාවකදී මේ පින්වතුන්ට මතක ඇති මේ දහම් වැඩ සටහන තුලින් අපි ධර්ම කාණ්ඩයක් මතක් කළා උපනිශ්‍රය ප්‍රත්‍යය කියලා. උපනිශ්‍රය කියලා කිව්වේ බලවත් වූ උපකාරය කියන එකයි. බලවත් වූ උපකාරය ප්‍රත්‍යය වෙන ආකාරය අපි කියලා දුන්නා. ඒ කාරණයේ තිබෙනවා අවස්ථා තුනක්. ආරම්මණය වශයෙන් උපනිශ්‍රය වෙනවා කියලා කිව්වා. අනන්තර වශයෙන් උපනිශ්‍රය වෙනවා කියලා කිව්වා. ප්‍රකෘර්ති වශයෙන් උපනිශ්‍රය වෙනවා කියලා කිව්වා.

මම ගිය අවස්ථාවේදී ආරම්මණ වශයෙන් උපනිශ්‍රය වෙන ආකාරය මේ පින්වතුන්ට කුසල වශයෙන් අකුසල වශයෙන් අව්‍යාකෘත වශයෙන් ඒක අරමුණු වෙන්නේ කොහොමද, ප්‍රත්‍යය ධර්මයන් වෙන්නේ කොහොමද, ප්‍රත්‍යය උප්පන්නයන් වෙන්නේ කොහොමද කියලා දුන්නා.අද මම මේ පින්වතුන්ට කියලා දෙන්න යොදාගත්ත ධර්ම කොට්ඨාසය ඒකෙම තව ඇඳියක් හැබැයි ඊට කලින් අපි නැවත අපි හිත් වලට මේ කරුණු ටික සිහි ගන්වා ගනිමු.

ලොව්තුරා බුදුරාජාණන්වහන්සේ අපිට දේශනා කළේ හේතුව සහ ඵලය. හේතුවයි ඵලයයි දේශනා කරනකොට එක එක්කෙනාගේ ප්‍රඥාවේ හැටියට ශ්‍රද්ධාවේ හැටියට ධර්මයන් මුහුකුරාගිය ආකාරයට තමයි උන්වහන්සේ දේශනා කරන්නේ. ධර්මය වැඩිලා නැති ධර්මය මුහුකුරා ගියේ නැති ධර්මයෙන් මෙරීම් ස්වභාවයට පත් වෙච්ච නැති හිත් තිබෙන අයට බුදුරාජාණන් වහන්සේ ධර්ම දේශනා කරන්න ගියේ නෑ ගැඹුරින්. ඒක අපි හොඳට මතක තියා ගත යුතුයි. ඒ වාගේම හොඳට මේරුණු හිත් තිබෙන අයට ශ්‍රද්ධාවෙන් ප්‍රඥාවෙන් සමාධියෙන් මේරුණු හිත් තිබෙන අයට බුදුරාජාණන්වහන්සේ ධර්මය දේශනා කරන්න කිසිසේත් පසුබට උනේ නෑ. බොහෝම කරුණාවෙන් බොහෝම මෛත්‍රීයෙන් ළං වෙලා දයාවෙන් කරුණාවෙන් ධර්මය දේශනා කළා, ඒ සිත් වලට නිර්වාණ ධාතුව සපර්ශ කරවලා දෙන්න. එතකොට මේ හේතු ඵල ධර්ම ටික දේශනා කරනවා කෙටි ක්‍රමයට සහ විස්තර ක්‍රමයට. මෙතැන තිබෙන්නෙත් හේතු ඵල ධර්ම පුංචියට කඩලා පුංචියට බෙදලා පුංචියට විමර්ශනය කරලා ඒවායේ තිබෙන්නාවූ ධර්ම

හොඳට අහුකරලා දෙන එකයි. පෙළ ගස්සලා දෙන එකයි. ඒවගේම විස්තර කරලා දේශනා කරන එකයි. එයින් කොටසක් තමයි අපි මේ කථා කරන්නේ. ඒ තමයි ප්‍රත්‍යය විභාගය. මෙතැන හේතු ඵල ධර්ම තමයි බුදුරාජාණන් වහන්සේ දේශනා කරන්නේ.

මේ හේතු ඵල කියන්නේ ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්න ධර්ම හැටියට. මෙහි ධර්මතා දෙකක් කියනවා. ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්න ධර්මය. ප්‍රත්‍යය කියලා කියන්නේ යමක් ඇති වෙන්න, යමක් පහළ වෙන්න, යමක් මතුවෙන්න සහ පවතින්න මුල් වෙන ප්‍රධාන කාරණයක් වෙන ධර්ම වලට. ඒ ප්‍රත්‍යය ධර්මයේ බලයෙන් ඒ ප්‍රත්‍යය ධර්මයේ ආනුභාවය නිසා තවත් යමක් අනතුරුව ළඟ හෝ දුර පහළ වෙනවා නම් මතුවෙනවා නම් ඒකට පාවිච්චි කරන වචනය පච්චුපන්නය = ප්‍රත්‍යය නිසා උපන්න දේ = ප්‍රත්‍යය උප්පන්නය. ඔය කාරණය අපි හොඳට හිතේ තියා ගන්න ඕනැ. බුදුරජාණන්වහන්සේ දේශනා කළේ ප්‍රත්‍යය සහ ප්‍රත්‍යය උප්පන්නය. පටිච්චසමුප්පාදය කියන්නේ පටිච්චසමුප්පන්න ධර්ම. හේතුව නිසා හටගත්ත ධර්ම.

අද අපි උපනිශ්‍රය ප්‍රත්‍යය යටතේ පකතූපනිස්සය පිළිබඳව කරුණුටිකක් දැනගන්න එක වටිනවා. මේකට කියන්නේ ප්‍රකෘති උපනිශ්‍රය කියලා. මේ ප්‍රකෘති උපනිශ්‍රය එදිනෙදා ජීවිතියේදී කෙරෙන්නා වූ දේවල් වලට බැස ගන්න, ධර්මය පොඩ්ඩක් හාරා අවුස්සලා මෙනෙහි කරගන්න හරි වටිනවා. හරි වටිනා මග පෙන්වීමක් ඒවගේම අපේ හිත ඒ පැත්තට නැඹුරු කිරීමක්, ධර්ම විග්‍රයක්.

අපි ඉස්සෙල්ලා දැන ගනිමු මේ ප්‍රකෘතිය කියන්නේ මොකක්ද කියලා. උපනිශ්‍රය කියලා කියන්නේ බලවත් උපකාරක හේතුව. ප්‍රකෘතිය කියලා කියන්නේ අපේ හිත්වල තිබෙනවා ධර්ම ස්වභාවයක්, ඒ ධර්ම ස්වභාවය නිසාම ප්‍රකෘතියෙන් පහළ වෙන්නාවූ ප්‍රකෘතියෙන්ම ඉපදෙන්නාවූ ප්‍රකෘතියෙන්ම හිත්වල තිබෙන්නාවූ ධර්ම හේතු කරගෙන අපේ සන්තානවල යම් යම් ධර්ම පහළ වෙනවා. ආන්න ඒකට කියනවා ප්‍රකෘතිය නිසා පහළ වෙන ධර්ම විස්තර කරන **ප්‍රකෘති උපනිශ්‍රය ප්‍රත්‍යය** කියලා. ඕකට යොදලා තිබෙන පාලි ධර්ම විග්‍රය පොඩ්ඩක් ස්පර්ශ කරමු මෙන්න මේ විදියට _

ධර්මතා කීපයක් තිබෙනවා එනම් ශ්‍රද්ධාව සීලය සුතය ත්‍යාගවන්ත ගතිය ප්‍රඥාව = **(සද්ධා සීල සුත චාග පඤ්ඤා)**. මේවා කොහෙද තිබෙන්නේ? ශ්‍රද්ධාව තිබෙන්නේ සන්තානයේ. ඒක හිතට ප්‍රකෘතියෙන්ම පිහිටන මතුවෙන ධර්මයක්. ඊළඟට සීල ගුණය = චේතනා සීලය. සුතය කියන්නෙත් තමා තුලම තිබෙන්නා වූ අසා දැන ගන්නා වූ ගතිය. ඊළඟට ත්‍යාගවන්තකම ප්‍රඥාවන්ත කම අපේ හිත් වල තිබෙන ධර්ම. මේ වාගේ ධර්ම වලට කියනවා ප්‍රකෘතියෙන්ම පිහිටන මතුවෙන ඇතිවෙන ධර්ම කියලා. ඒක බාහිර එකක් නොවෙයි. මේක ඇතුලත තිබෙන එකක්. මේ ධර්ම නිසා මෙන්න මේ විදියට කියනවා...

**පකතූපනිස්සයො – සද්ධං උපනිස්සාය දානං දෙති, සීලං සමාදියති, උපොසථකම්මං කරොති =**

ශ්‍රද්ධාව කියන ඇතුලත තිබෙන ප්‍රකෘති ධර්මය මුල්කරගෙන ඒ ධර්මය බලවත් කාරණයක් කරගෙන කෙනෙක් දානය දෙනවා, කෙනෙක් සීලය සමාදන් වෙනවා, උපෝසථ කර්මයට නැඹුරු වෙනවා.

**ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති,** = ශ්‍රද්ධාව බලවත් කාරණයක් කරගෙන උපකාරයක් කරගෙන ධ්‍යාන ධර්ම උපදවනවා. විපස්සනාව කරන්න පෙළඹෙනවා. විපස්සනා වඩනවා.

**මග්ගං උප්පාදෙති** = මාර්ග උප්පාදනය කරනවා. (මාර්ග ධර්ම).

**අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති** = අභිඤ්ඤා ධර්ම සමාපත්ති ධර්ම උප්පාදනය කරනවා.

මේ ඉපදෙන ධර්ම වලට කියනවා එනම් දානය දීම, සිල් සමාදන් වීම, උපෝසථකර්ම කිරීම, ධ්‍යාන ධර්ම වැඩීම, විදර්ශනා වැඩිම, මග වැඩීම, අභිඤ්ඤා උප්පාදනය කිරීම ආදී ධර්ම වලට කියනවා ප්‍රත්‍යය උප්පන්න ධර්ම කියලා. මේවා ප්‍රත්‍යය ධර්ම නොවෙයි. මේවා ප්‍රත්‍යය උප්පන්න ධර්ම. මේවා සිද්ධ වෙන්න මේවා හැදෙන්න මේවා කෙරෙන්න බලවත් වූ හේතුවක් වෙන්නේ බලවත් වූ උපනිශ්‍රය ධර්මයක් වෙන්නේ අර ඇතුලත තිබෙන්නා වූ ප්‍රකෘර්තියෙන්ම හිතට සම්බන්ධ ශ්‍රද්ධාවයි. ඒ ශ්‍රද්ධාව මේවා මතු කරන්න පුදුම විදියට පෙළ ගස්සනවා ඉස්සරහට දෙනවා. අපි මේ කාරණය මේ විදියට හිතමු.

යම් කිසි කෙනෙකුගේ හිතේ සද්ධාවක් පහළ වෙනවා. ඒ කියන්නේ සද්ධාව කියන ධර්මය බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නය කෙරෙහි පැහැදීමක් මතුවෙනවා, හැදෙනවා, උපදිනවා. මේ සද්ධාව ඇති උනහම මතු උනහම එයාට සද්ධාව මුල් කරගෙන වඳින්න හරි ගාථාවක් කියන්න හරි එහෙම නැත්නම් එක නමකට හෝ කිහිප නමකට හෝ දානයක් පූජා කරන්න හෝ එහෙම නැත්නම් සීලය දවසට සිල් සමාදන් වෙන්න හෝ නිත්‍යය සීලයක් සමාදන් වෙන්න හරි මොකක් හරි සිතක් පහළ වෙනවා. ඊට පස්සේ ඒ සීලය සමාදන් වෙනවා. ඊළඟට උපෝසථ සමාදානය කරනවා. මේවා කෙරෙන කොට දානයක් දෙනකොට ඇති වෙනවා මහා කුසල සිත්. දාන චේතනා පහළ වෙනවා සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික සසංඛාරික වශයෙන්. ආන්න ඒ කුසල් සිත් ටික මේ වේලාවේ පහළ වෙන්න නම් ඒ කුසල් සිත්ටික හැදෙන්න මුලින් සිත පොළඹවාපු මුලින් හිතට බලවත් කාරණයක් වූ මුලින් හිත ඒකෙන් කුල්මත් කළාවූ පෙඟීමක් කළාවූ ප්‍රසාදය ඇති කළාවූ ධර්මය තමයි අර සද්ධාව කියන ධර්මය. ඒ සද්ධාව කියන ධර්මය බලවත් උනා හේතුවක් උනා කාරණයක් උනා මේ පස්සේ දානේ වැඩේ කෙරෙන්න. දානය සිද්ධ වෙන තැන කුසල් සිතුවිලි කුසල චෛතසික ධර්ම තමයි පහළ වෙන්නේ. ඒ ටික තමයි සද්ධාවේ ආනුභාව බලයෙන් පහළවෙන ප්‍රත්‍යය උප්පන්න ධර්ම. ඒ ප්‍රත්‍යය උප්පන්න ධර්ම ඇති කරපු ප්‍රත්‍යය ධර්මය තමයි සද්ධාව. ඔය විදියට උපනිස්සය ප්‍රත්‍යය සහ උපනිස්සය ප්‍රත්‍යය නිසා පහළ වෙන ප්‍රත්‍යය උප්පන්න ධර්මයන්ගේ හැටි අපිට තේරුම් ගන්න පුළුවන්.

ඊළඟට ස්වාමීන්වහන්සේ කෙනෙක් පිළිබඳව සද්ධාවක් පහළවෙනවා. යම් කිසි ස්ථානයකට ගිහහම ඒ ස්ථානයේ තිබෙන පිරිසිදුකම ප්‍රසාදණීය ගතිය ඒකෙ තිබෙන්නාවූ මන වඩන ගතිය නමුත් ලෝභයට නොවෙයි, හිතට යම්කිසි සද්ධාවක් මතු කරලා දෙන ගතිය තිබුණ නිසාම පුදුම සද්ධාවක් හට ගත්තා. ස්වභාවයෙන්ම ඒ සද්ධාවේ මෙහෙය වීම නිසා ඒ ස්ථානයේ බෝධියක් තිබුනොත් බෝධියට වඳිනවා. විහාරයක් තිබුණොත් විහරයට වඳිනවා. ඒවාගේම ස්වාමීන්වහන්සේ නමක් හිටියොත් ස්වාමීන්වහන්සේට වඳිනවා. දානයක් දෙනවා. ආන්න ඒ වගේ දේවල් කරන අවස්ථාවේදී ඇතිවෙන පිං සිතුවිලි සියල්ලක්ම අර සද්ධාව නිසා පහළ වෙච්ච දේවල්. ඒක නිසා ඒවාට කියනවා සද්ධාව මුල් කරගෙන තිබෙන ප්‍රත්‍යය උප්පන්න ධර්ම කියලා.

සමහර වෙලාවට භාවනා කරනකොට අපේ හිත්වල ඇතිවෙනවා ඒ විපස්සනාව කෙරෙහි හෝ මෛත්‍රී භාවනාව වශයෙන් හෝ බුදුගුණ භාවනාව වශයෙන් හෝ පුදුම විදියේ සද්ධාවක්. ඒ සද්ධාව ඇති උනහම ඒකෙන් මෙහෙය වීමක් කරලා motivation එකක් ලැබිලා ඊට පස්සේ ධ්‍යාන වශයෙන් හරි විපස්සනා වශයෙන් හරි භාවනා වඩනවා. එහෙම සද්ධාව තිබෙත්දී භාවනා වැඩුවහම ඉක්මනටම ඒ වැඩේ සිද්ධ වෙන ගතියකුත් තිබෙනවා. මෙන්න මේ විදියට ශ්‍රද්ධාව නිසා විපස්සනාවටත් ධ්‍යාන භාවනාවටත් උපෝසථ කර්මයටත් ඒවගේම සද්ධාව උපයෝගී කරගෙන මාර්ග ඵල අවබෝධ කරගන්නත් අවස්ථාව තිබෙනවා.

මෙන්න මේ ධර්ම ටිකට අර ප්‍රකෘතියෙන් පහළ වෙන්නා වූ සද්ධාව මුල් වෙනවා.

තව එකක් තිබෙනවා සීලය කියලා. සීලය කියලා කියන්නෙත් හරි පුදුම විදියේ උපකාරක ධර්මයක්. මෙතැන සීලය කියලා සලකන්නේ කමාවචර කුසල් සිත් වල තිබෙන විරති චේතනාව. ඒ කියන්නේ වැරදි වැඩ නොකරන ඒවගේම සීලය හැටියට සලකන විරති ගතියක් තිබෙනවා. එතකොට ඒ විරති චේතනාව හෙවත් ඒ සීල ගතිය දානමය පිංකමකටත් වෙනත් දේවල් සිද්ධ කරන්නත් ඒකාන්තයෙන්ම උපකාර වෙනවා.

මේක තවත් විදියකට තේරුම් ගන්න මේ විදියට හිතමු. යම් කිසි වරදක් කරන්න අවස්ථාවක් තිබුණොත් එතැනදී ඒ වරද 'මම නොකර ඉන්නවා' කියලා දැඩි අධිෂ්ඨානයක් ගන්නවා. ඒ අධිෂ්ඨානය එන්නේ සීලය වශයෙන්. ඒක එන්නේ විරති වශයෙන්, සිද්ධ වෙන්නේ සීලය. ඒ විරති චේතනාව දැන් පහළ උනා. පස්සේ අවස්ථාවකදී තමන්ට ඒකෙ ප්‍රතිඵලය ලැබෙනවා. ඒ කියන්නේ තමන්ට කරන්න අවස්ථාවක් තිබිලත් වරදක් නොකර සිටීම පිළිබඳව සීලය වශයෙන් තමන්ට පුදුම නිදහසක්, සැනසිල්ලක්, වරදකට දඬුවම් නොවිඳින ගතියක්, හිත නිවිච්ච ගතියක්, ශාන්ත ගතියක් එතැනදී ඇතිවෙනවා. ඒ ගතිය මෙනෙහි කිරීම් වශයෙන් හෝ වේවා ඇතිවෙනකොට කුසල් සිත් පහළ වෙන්නේ සීලය නිසා. මෙසේ සීලය නිසා පසුව ඇතිවෙන ධර්ම පච්චුප්පන්න වෙනවා. සීලය ප්‍රත්‍යය ධර්මය වෙනවා. සීලය කිච්චේ විරතිය.

තව එකක් තිබෙනවා. මේ පින්වතුන් බණ හොඳට අහනවා. විස්තර හොයනවා. පොත පත බලනවා. ධර්මය අහනවා. දැන් මේ ධර්මය අහන්න අහන්න මේ පිළිබඳව පුදුම විදියේ දැනුමක් ඇති වෙනවා. දැනුම වගේම යමක් හොඳට කරන්නේ කොහොමද කියන දේ හොඳට දන්නවා. සීලයක් සමාදන් වෙන්නේ කොහොමද? දැන් බොහෝ අය සිල් සමාදන් වෙන බව හැබැව. උපෝසථය සිද්ධ කරන බව හැබැව. හැබැයි ඒ දේ සිද්ධ කරන්නේ දැනුමක් එහෙම හරියාකාරව තිබිලා නොවෙයි. පුරුද්දට සමහර ඒවා ශ්‍රද්ධාව නිසා කරගෙන යනවා. හැබැයි ධර්මය පිළිබඳව දැනුම වැඩෙන වැඩෙන්න ඒ දැනුම නිසා ඒ සූතය නිසා හරි පිළිවෙලකට ඒ වැඩේ කරන්න පුළුවන්. දානයක් දෙන්නත් සූතමය ඥානය අවශ්‍යයයි. ඒ කියන්නේ ධර්මය අහලා තිබෙන බව. එතකොට හොඳට කරන්න පුළුවන්. දැකලා කරනවා. ධර්මය අහලා කරනවා. සිල් රකින හැටි දැකලා කරනවා. සිල් රැකීමේ ආනිසංස අහලා දැනගෙන කරනවා. සමහර අය දැකලා භාවනා කරනවා. සමහර අය භාවනා කරන හැටි පිළිවෙල හොඳට බණෙන් අහලා තේරුම් ඇතුව කරනවා. මේවගේ ක්‍රියාවන්ගේ තිබෙන්නේ ආකාර දෙකක්. මේ සූතමය ගතිය, ධර්මය අසා දැනගෙන තිබීම විශේෂයෙන්ම බණ අහන්නේ මෙහෙමයි කියලා දැනගෙන තිබීමත් බණ ඇසීමට හේතු වෙනවා. පස්සේ ඇතිවෙන්නා වූ ඥානය ඉසෙල්ලා ඇති වූ සූතමය ගතියෙ ප්‍රතිඵලයක්. ඒක නිසා සූතවත් ගතිය බහුශ්‍රුතභාවය ප්‍රත්‍යය වෙනවා පසුව කරන්නා වූ විපස්සනාවට, සීල සමාදානයට, ධ්‍යාන භාවනාවට, මාර්ගය වැඩීමට සහ ඉඳගැනීමට පවා ඒවා උපකාර වෙනවා. පොතක් පතක් කියවීමට ඒක උපකාර වෙනවා. ගමනක් බිමනක් සිහියෙන් කල්පනාවෙන් යෑමට ඒමට මේවා උපකාර වෙනවා. මේ **සූතය** කියන්නෙත් **ප්‍රකෘති ධර්මයක්**. ඒ නිසා පසුව පහළ වෙන චිත්ත චෛතසික **ධර්මයෝ ප්‍රත්‍යය උප්පන්නයි**.

තවත් පැත්තකට අපි හැරුනොත් තිබෙනවා **ත්‍යාගවන්ත ගතිය**. ත්‍යාගයත් එහෙමයි. ත්‍යාගය කියලා කියන්නේ දානය. දානය කියලා කියන්නේ අලෝභී චේතනාව. ලෝභ නැති චේතනාව. ඒ ලෝභ නැති චේතනාවත් අර සීලාදී ගුණ ධර්ම දියුණු කරන්න විශේෂයෙන් උපකාර වෙනවා.

තව එකක් තිබෙනවා.

**සද්ධා... සීලං... සුතං... චාගො... පඤ්ඤා ... සද්ධාය... සීලස්ස... සුතස්ස... චාගස්ස... පඤ්ඤාය උපනිස්සයපච්චයෙන පච්චයො.**

• **සද්ධා සද්ධාය උපනිස්සයපච්චයෙන පච්චයො** = සද්ධාව සද්ධාවටම උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා.

සීලය සිලයට උපකාර වෙනවා. **සද්ධාව, සද්ධාවට සීලයට සුතයට චාගයට ප්‍රඥාවට** යන ධර්ම පහට උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යය වෙනවා. ඉස්සරවෙලා ඉස්සරවෙලා පහළ වෙන්නාවූ ශ්‍රද්ධාව නිසා, ඉස්සරවෙලා පහළ වෙන සීල ගුණය නිසා සුත ගුණය නිසා ත්‍යාගවන්තකම නිසා ප්‍රඥාව නිසාත් පස්සේ පස්සේ පහළ ධර්ම වලට විශේෂයෙන්ම උපකාර වෙනවා.

තව එකක් අපි මෙතැනදී දැන ගන්න ඕනෑ. සද්ධාවේ තිබෙනවා සද්ධාව වැඩීම වශයෙන් සහ අරමුණු කිරීම වශයෙන් කෙරෙන්නා වූ විස්තරයක්. සද්ධාව කියන එකේ ස්වභාවය විශ්වාස කිරීම, පිළිගැනීමේ මාත්‍රය. බුදුරාජාණන් වහන්සේ කෙරෙහි ධර්මරත්නය කෙරෙහි සංඝරත්නය කෙරෙහි තිබෙන්නාවූ විශේෂයෙන්ම පැහැදීම් ආකාරවූ ලක්ෂණය තමයි සද්ධාව කියලා කියන්නේ. **'ආගමනසද්ධාව' 'අධිගම සද්ධාව'** ඒවාගේම **'ප්‍රසාද සද්ධාව'** සහ **'ඕකප්පන සද්ධාව'** කියලා සද්ධාව ආකාර හතරකට විස්තර කරනවා. **ආගමනසද්ධා** කියලා සඳහන් කරන්නේ බෝධිසත්වයන් වහන්සේලාගේ සිත්වල තිබෙන මහා පුදුමාකාර ජීවිත පරිත්‍යාග කරන්න පුළුවන් තරම් මහා බලයක් තිබෙන්නාවූ සද්ධාවට. ඒක විශේෂයෙන්ම පිහිටන්නේ නියත විවරණ ලැබුවාට පස්සේ බෝධිසත්වයන් වහන්සේලාගේ සිත් වල. **අධිගම සද්ධාව** කියලා කියන්නේ චතුරාර්ය සත්‍යය ධර්මයන් අවබෝධ උනාට පස්සේ පිහිටන්නාවූ සද්ධාව. ඒක චතුරාර්ය සත්‍යය සමග අවබෝධ වෙන ලෝකෝත්තර සද්ධාව. **ප්‍රසාද සද්ධාව** කියලා කියන්නේ බුද්ධ ධම්ම සංඝ යන ත්‍රිවිධ රත්නය කෙරෙහි හරි බලවත් පැහැදීම් ආකාරයක්. පැහැදීමෙන් බැස ගත්ත ආකාරයක්. **ඕකප්පන සද්ධාව** කියලා කියන්නේ රත්නත්‍රයේ මේ මේ ගුණ තිබෙනවා කියලා දැනෙන කොට ඇඟට දැනෙන ඇඟ කිලි පොලා යන මහා බලවත් සද්ධාවට. ප්‍රසාද සද්ධාවයි ඕකප්පන සද්ධාවයි වෙනස්. ප්‍රසාද සද්ධාව නාම මාත්‍ර සද්ධාවක් වගෙයි. නමුත් ඕකප්පන සද්ධාව එහෙම නොවෙයි. ධර්ම කාරණා ගැන අහන්න අහන්න බුදුගුණ ගැන අහන්න අහන්න ඒ ගුණත් එක්ක කැවීගෙන යන්නාවූ ඒ සද්ධාවට කියනවා **ඕකප්පන සද්ධාව** කියලා.

මෙන්න මේ කියන්නා වූ සද්ධාවයි සීල සමාදාන ආදී අවස්ථාවල ඇතිවෙන ජවන්සිත්වල පහළ වෙන විරති චෛතසිකයන්ගේ බලය, ඒවාගේම බණ ඇසීම නිසා ඇතිකරගත්තා වූ ධර්මඥාණය, ඒ වාගේම අලෝභී චේතනාව, විශේෂයෙන්ම ප්‍රඥාව කියන තැනේදී කියන්නේ කර්මය කර්ම ඵලය පිළිබඳව දැනෙන්නාවූ ප්‍රඥාව. (ප්‍රඥාව තිබෙනවා ලෝකෝත්තර සහ ලෞකික ප්‍රඥාව කියලා. මෙතැන කියන්නේ විශේෂයෙන්ම කම්මස්සකත ඥානයට සම්බන්ධ වූ කර්මය කර්ම ඵලය විශ්වාස කරන්නා වූ ඒ ඥානය). ඉතින් මේ කියන්නා වූ ධර්මතා 5 සද්ධාව සීලවත් ගතිය සුතවත් ගතිය ත්‍යාගවන්ත ගතිය ප්‍රඥා ගතිය ආදී මේ කියන්නාවූ ධර්ම වැඩ කරනවා තමාගේ හිතේ තිබෙන ප්‍රකෘති ධර්ම හැටියට. පස්සේ පස්සේ ඇතිවෙන ධර්ම ප්‍රත්‍යය උප්පන්න ධර්ම බවට පත්වෙනවා.

මේ ප්‍රකෘති කාරණය අපි බලමු අද මේ කරන වැඩේට සම්බන්ධ කරලා. මේ බණ අහන වැඩේට මේ ධර්ම සකච්ඡා වැඩේට මේ ධර්ම බලවත් වෙලා තිබෙනවා. එකක් තමයි හිතේ පහළ වෙන්නා වූ සද්ධාව. දැන් මේ බණ මෙනෙහි කිරීම තුල පහළ වෙන බණ හිතීම තුල පහළ වෙන මේ කුසල ධර්ම සමුදායට, මේ චිත්ත චෛතසික ධර්ම සමුදායට එකානත්යෙන්ම මීට ඉස්සෙල්ලා අහපු බණ, ඒ සුතවත් බව හේතු උනා. සද්ධාව හේතු උනා. ඒවාගෙන් ලබාගෙන තිබුණ දැනුම හේතු උනා. මෙන්න මේ විදියට මුලින් පහළ කරලා තිබ්ච්ච ඒ ධර්ම ටික මේ වේලාවට උපකාර උනා උපනිශ්‍රය ප්‍රත්‍යයෙන්. ඒක නිසා තමයි මේ පින්වතුන් අනිත් ඔක්කොම වැඩ නවත්වලා මේකට හැරිලා බලාගෙන

ඉන්නේ. අන්න ඒක අපි තේරුම් ගන්න ඕනෑ ප්‍රකෘති උපනිශ්‍රයෙහි තිබෙන්නා වූ ගුණයක් කියලා. මේ කථා කළේ කුසල වශයෙන්.

මේකේ තව පැත්තක් තිබෙනවා. ඒ පැත්තත් අපි දැන ගන්න ඕනෑ. මේ අපි කියාගෙන ගියේ සද්ධාව පිහිට වෙනවා සිල් රකින්න දානය දෙන්න වන්දනාවේ යන්න කියලයි. ඔය හැම එහෙකටම උපකාර වෙන ආකාරය තමයි ඔය මතක් කළේ. මේකේ අනිත් පැත්ත තමයි ශ්‍රද්ධාව බලවත් කාරණයක් වෙලා උපනිශ්‍රය වෙලා මාන්නය හට ගන්නවා. දිට්ඨිය හට ගන්නවා.

**සද්ධං උපනිස්සාය මානං ජප්පෙති, දිට්ඨිං ගණ්හාති** = සද්ධාව ප්‍රධාන වෙලා මාන්නය හටගන්නවා දිට්ඨිය හටගන්නවා.

කොහොමද ඕක හැදෙන්නේ? අපි හිතමු මෙහෙම. වන්දනා ගමනක් ගියා පිරිසක් එක්ක. එක්කෙනකුට සද්ධාව තිබෙනවා. වන්දනා ගමනක් ගිහිල්ලා එයා හොඳට වැඳගෙන පුදාගෙන එනවා ගම්මාන බලාගෙන. එහෙම ආවහම එයාගේ සද්ධාවෙන් එයා නිස්කලංකව ගිහිල්ලා වැඳ ගත්තු හැටි ගාථා කියපු හැටි පිරිත් කියපු හැටි 'මට විතරයි මේ සද්ධාව මේ වගේ තිබුණේ, අනිත් අය ගියා විතරයි' කියලා අනිත් අයව පහත් කරලා තමන්ව හුවා දක්වාගන්න ගතියක් ඇති වෙනවා. ඒ ගතිය ඇත්තටම අකුසල්, ඒක මාන්නය. 'මගේ ශ්‍රද්ධාව' කියලා ගන්නකොට දෘෂ්ටිය. ශ්‍රද්ධාව කියන එකට 'මම' කියලා දැම්මා. එතැනදී ශ්‍රද්ධාව ස්වභාවයෙන් හිතක පහළ වෙන ධර්මයක් හැටියට නොසලකා ඒක 'මගේ ශ්‍රද්ධාව, මට විතරයි මෙහෙම තියෙන්නේ' කියලා හිතනකොට මාන්නයත් ඇතිවෙනවා දෘෂ්ඨියත් ඇතිවෙනවා. මේ තමයි ශ්‍රද්ධාව නිසා මාන්නය ඉලිප්පී එන හැටි. දෘෂ්ඨිය ඉලිප්පී එන හැටි.

ඔය වැඩේම සිද්ධ වෙනවා සීලය නිසා. ඒක ගොඩක් අයට වෙන්න පුළුවන්.

**සීලං උපනිස්සාය මානං ජප්පෙති, දිට්ඨිං ගණ්හාති** = සීලය මහා බලවත් කාරණයක් වෙලා 'මම තමයි සිල්වත් මගේ සීලය වටිනවා මමයි සිල්වත් අනිත් අයගේ සිල් මෙහෙම නෑ' කියලා තමන් හුවා දක්වාගෙන කථා කරනවා හිතනවා සලකා ගන්නවා අනිත් අය පහත් කරනවා. එතකොට සීලය තමයි මෙයාගේ මාන්නයට ප්‍රධාන කාරණයක් උනේ, හේතුවක් උනේ. මගේ සීලය කියලා දෘෂ්ඨියක් ඇති කරගන්න කාරණයක් උනේ.

තවත් කාරණයක් තිබෙනවා, ඒ තමයි

**සුතං උපනිස්සාය මානං ජප්පෙති, දිට්ඨිං ගණ්හාති** = සුත්වත් ගතිය හේතුවෙලා ප්‍රධාන කාරණයක් වෙලා 'මම මේ මේ පොත් කියවලා තිබෙනවා, මම මේ මේ දේවල් අහලා තිබෙනවා, මම මේ මේ දේවල් දැනගෙන තිබෙනවා. මම මේ විදියට අහලා දැනගෙන තිබෙනවා' කියලා සුතය මුල් කරගෙන හරි මාන්නයක් ඇතිවෙනවා. ඒවගේම දෘෂ්ඨිමත් ගතියක් ඇතිවෙනවා.

**චාගං උපනිස්සාය මානං ජප්පෙති, දිට්ඨිං ගණ්හාති** = තමන්ගේ දානය නිසා 'මම මේ විදියටයි දානය දෙන්නේ මේ විදියටයි මම දානමය කටයුත්ත කරන්නේ' කියලා තමන්ගේ දානය හේතු කරගෙන මාන්නය උපදවනවා. දානය තමයි එතැනදී ප්‍රත්‍යය, මාන්නය තමයි ප්‍රත්‍යය උප්පන්නය. දෘෂ්ඨිය තමයි අනිත් ප්‍රත්‍යය උප්පන්නය.

**පඤ්ඤං උපනිස්සාය මානං ජප්පෙති, දිට්ඨිං ගණ්හාති** = ප්‍රඥාව නිසාත් මාන්නය ඇතිවෙනවා දෘෂ්ඨිය ඇතිවෙනවා.

අනිත් එක තමයි හරියට අනාගතයට පැත්තට හැරෙන ලෝභය පැත්තටත් මේක බලපානවා. ඒ කියන්නේ භාව රාගය එන්න පුළුවන්. භව රාගය කියලා කියන්නේ භව ප්‍රාර්ථනාව. භවයට යන්න ඕනෑ කමක් තියෙනවා කියලා කියන්නේ ලෝභයක්, ඒක අකුසලයක්. තමන්ට ශ්‍රද්ධාව තිබුණා, තමන්ට බණ ඇසීමක් උනා, මේවා හොඳයි, මේවා බලවත් කාරණයක් වෙලා ' මම මේ මේ ජීවිතියේ මේ මේ දිව්‍ය ලෝකයේ මේ මේ භවවල උපදිනවා, මේ විදියට මනුස්සයෙක් වෙනවා, මේ විදියට බ්‍රහ්මලෝකයේ උපදිනවා' කියලා ලෝභ කරනවා. ඒවාගේම තමයි දෘෂ්ඨියෙන් ප්‍රාර්ථනා කරනවා. මේ භව ප්‍රාර්ථනාවල් කියන දේවල් ලෝභ සිත්. ඒවාට ප්‍රකෘති උපනිස්සය ප්‍රත්‍යයයෙන් ප්‍රත්‍යවෙනවා ශ්‍රද්ධාව ආදී ප්‍රකෘතියෙන්ම තිබෙන්නා වූ ධර්ම.

සමහර වෙලාවට මේ සීල ගතිය සුත ගතිය චාගවත් ගතිය තරහ යන්නත් උපකාර වෙනවා, බලවත් කාරණයක් වෙනවා. ඒක වෙන්නේ මාන්නයත් පොඩ්ඩක් හේත්තුවෙලා. තමන් හොඳට පොත පත කියවලා ඉන්න කෙනෙක් කියලා මාන්නයක් හැදෙනවා. ඒකට පිළිගැනීමක් ඒ තමන්ගේ සුතවත් ගතියට තමන්ගේ සීලවත් ගතියට තමන්ගේ දානයට තමන්ගේ ඒ ඥානවන්ත වැටහීමට ඒ ප්‍රඥාවන්ත ගතියට අනිත් අයගේ පිළිගැනීමක් අගේ කිරීමක් ඒ අයගෙන් වන්දනාවක් ගරුකිරීමක් සැලකිල්ලක් හම්බ වෙන්නේ නෑ. එතකොට තරහා යනවා. එතකොට කියනවා = **සද්ධා දොසස්ස උපනිස්සයපච්චයෙන පච්චයො**. සද්ධාව ද්වේශයට බලවත්ම කාරණයක් වෙනවා. ඔය සමහර අය සමහර වෙලාවට කියනවා 'මම මෙච්චර කරලත් මාව සතපහකට ගන්න ගත්තේ නෑ' කියලා. ඒ තියෙන්නේ තරහව සහ මාන්නය. ඒවා ඇති වෙන්න ඔය කරුණු ටික බලපානවා.

- **සද්ධා රාගස්ස උපනිස්සයපච්චයෙන පච්චයො**
- **සීලං දොසස්ස උපනිස්සයපච්චයෙන පච්චයො**

මේ තමයි **සද්ධා සීල සුත ත්‍යාග ප්‍රඥා** කියන තමා තුල තිබෙන ප්‍රකෘති ධර්ම මේ කිච්චාවූ අකුසල ධර්ම පහළ වීමට හේතුවෙන විදිය.

අනිත් එක තමයි ඔය සද්ධාව නිසා තණ්හාවෙන් බව භෝග, ප්‍රාර්ථනා, ඇඳුම් පැළඳුම්, යාන වාහන ආදී ගොඩාක් පැතීම් කරනවා ඒවා ඔක්කොම අකුසල චේතනා අකුසල ධර්ම. ඇත්තටම මේවා ඔක්කෝම පළවෙනුවෙන්ම ඇති වෙන්නාවූ ධර්මයන්ගෙන් හඳලා දෙන ගැම්ම. ඔය විදියට ධර්ම තිබෙනවා ප්‍රකෘති වශයෙන් පහළ වෙන උපනිස්සය ප්‍රත්‍යය ධර්ම.

අපි මේ කිව්වේ ආකාර දෙකක්. එකක් තමයි කුසල වශයෙන් ප්‍රකෘති උපනිස්සය බලපානවා කුසල ධර්මයන්ට. ඒ ප්‍රකෘති වශයෙන් පහළ වෙන කුසල ධර්ම ටික අකුසල ධර්මයන්ටත් බලපානවා. ඒවගේම තවත් එකක් තිබෙනවා.

- **සද්ධං උපනිස්සාය අත්තානං ආතාපෙති පරිතාපෙති** = කායික වශයෙන් දුකක් පහළ වෙන්නත් මේක හේතු වෙනවා..

සමහර නිගණ්ඨයෝ ඉන්නවා. ඒ ගොල්ලෝ ගිනි ගොඩක් ගහනවා. ගිනි ගොඩක් ගහලා ඒ ගිනි ගොඩේ තපිනවා. ඇඟ රත් කරනවා. ඒකෙන් ලැබෙන්නේ දුක්ඛ වේදනාවක්. නමුත් ඒ ගැන ඒ අයට පැහැදීමක් තිබෙනවා, මුලා වෙච්ච භක්තියක් තිබෙනවා. ආන්න ඒ වගේ සමහර වෙලාවට තුනුරුවන් ගුණ තිබෙන්නා වූ අයටත් සද්ධාව බලවත් කාරණයක් වෙලා බඩ ගින්නේ ඉන්නවා. ඒ අයට තුනුරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තිබෙනවා. සමහර විට ධූතාංග සමාදන් වෙනකොටත් ඕක තිබෙනවා. ඒක හැබැයි සීලබ්බත පරාමසයට ගැනෙන්නේ නෑ. සද්ධාව නිසා බඩ ගින්න දරාගන්නවා. නමුත් බඩ ගින්නේ දුක නැති වෙන්නේ නෑ. ඒක හයියට දරාගෙන ඉන්න ගතිය විතරයි තිබෙන්නේ.

**පරිතාපෙති** = තමන්ට ඉස්සෙල්ලා ඇති වෙච්ච ඒ වේදනාව තව දිගටත් අල්ලාගෙන ඉන්නවා.

සමහර වෙලාවට තිබෙනවා එකක් සොයා යෑමේ මූලික දුක්ඛය කියලා. ඒකට කියනවා පරියිට්ඨිමූලක දුක්ඛය කියලා. අපිට සද්ධාවක් ඇතිවෙනවා. අපි හිතමු අට පිරිකරක් පූජා කරන්න ඕන වෙනවා. ඕක ඉස්සර ගමේ තිබ්ච්ච වැඩක්. අට පිරිකරක් පූජා කරගන්න ඕනෑ කියලා සද්ධාවක් පහළ උනහම ඉස්සර තිබුණා ක්‍රමයක් ඒක තමයි අට පිරිකරට සම්මාදමේ යනවා අනිත් අයත් ඒකට එක්කාසු කරගන්න. සල්ලි එකතු කරන්නම නොවෙයි, අනිත් අයත් ඒකට සම්මාදම් කරගන්න. ඒ අයත් ඒ පිනට එක්කාසු වේවා කියලා. එහෙම යනකොට අව්වෙත් යනවා ඒවාගේම වැස්සෙත් යනවා. වතුර පිපාසයත් තිබෙනවා. මේ සියලුම පීඩාවන් දරන්න උනේ ඒ කුසලය කරන්න සද්ධාව මුල් වෙච්ච නිසා.

ඒවගේම තමයි සීලයටත්. සීලය නිසා තමන්ට යම් යම් දුක් අනුභව කරන්න සිද්ධ වෙනවා. පිඩාවල් ඇතිවෙනවා. බණ අහන්න යනකොටත් ඒවගේ. දානය දෙන්න යනකොටත් ඒවගේ. ඉස්සෙල්ලාම පහළ වෙනවා දානය දෙන්න ඕන කියලා ශ්‍රද්ධාවන්ත සිතක් සහ දාන චේතනාවක් පහළ වෙනවා. ඊට පස්සේ ඔය අරණ්‍යසේනාසන වලට ගියහම වෙනද වගේ නොවෙයි. ඒක තමන්ට අමුතු තැනක්. නිදා ගන්න කියලා හරියට තැනක් නෑ. ඉතින් ඔය ශාලාවල රැඳිලා ඉන්නයි තිබෙන්නේ. මදුරුවෝ දාඩිය අව්ව වගේ කායික දුක් අනුභව කරන්න සිද්ධ වෙනවා. මේ කායික පෙළීම් සියල්ලක්ම අර දාන චේතනාවත් ඊළඟට සුතය නිසා මේක කරන්න ඕනෑ කියන හැඟීමක් තිබෙන නිසා උපනිශ්‍රය ප්‍රත්‍යයයෙන් මේ ධර්ම ප්‍රත්‍යය වෙනවා.

ඉතින් මේ විදියට කුසල කර්මයක් සිද්ධ කරනකොට කුසල කර්මයට ඉස්සෙල්ලා තිබෙන්නාවූ ධර්ම සමූහය ප්‍රකෘති වශයෙන් උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙන ආකාරය තමයි මම මේ පින්වතුන්ට මතක් කළේ.

ඔය වගේම තමයි සත්ව ඝාතනයටත් හොරකම් කරන්නත් මේ ධර්ම හේතුවෙනවා. මේක පරෙස්සමෙන් තේරුම් ගන්න ඕනෑ. සමහර අයට දෙන්න ඕනේ කමකුත් තිබෙනවා. සද්ධාවකුත් තිබෙනවා. දී ගන්නත් බෑ. එහෙම උනහම දෙන්නත් ඕනෑ හැබැයි කාගෙන් හරි අරගෙන. එතකොට අකුසල පැත්තට යනවා. හැබැයි තමන් පාවිච්චි කරන්නෙත් නෑ. ඒ වගේ අවස්ථාත් තිබෙනවා. ඒකනිසා මේ ප්‍රකෘතියෙන් පහළ වෙන ඇතුලත තිබෙන්නා වූ ධර්ම තවත් ප්‍රත්‍යය උප්පන්න ධර්ම සමුදායකට පාදක වෙන මූලික හේතුවක් වෙන බලවත් උපනිශ්‍රය කාරණයක් වෙන විදිය මේ අනුසාරයෙන් අපිට තේරුම් ගන්න පුළුවන්. ඒ නිසා බුදුරාජාණන් වහන්සේ සත්ව නොවන්නා වූ පුද්ගල ස්වභාවයක පිහිටා නැත්තා වූ ධර්ම පරාසයක් තමයි ඔය ආකාර තුනකින් දේසනා කරන්නේ.

1). ආරම්මණ උපනිස්සය වශයෙනුත් බලවත් කාරණයක් වෙනවා.

2). අනන්තර උපනිස්සය වශයෙනුත් බලවත් කාරණයක් වෙනවා.

3). ප්‍රකෘති උපනිස්සය වශයෙනුත් බලවත් කාරණයක් වෙනවා.

අපි එදිනෙදා ජීවිතියේ කරන්නා වූ දේවල් වලට මොකක් හරි ඉස්සෙල්ලා පහළ වෙච්ච දෙයක් මහා බලවත් උපනිශ්‍රයකින් රුකුල් දෙනවා. ඒක නිසා තමයි මේක කරගෙන යන්නේ. මේ ධර්මතා ටික බුදුරාජාණන් වහන්සේ උන්වහන්සේගේ නුවණින් මේ සත්ව ලෝකයේ මේ මේ දේවල් සිද්ධ වෙන්නේ මේ නාම ධර්ම වල බලයෙන් කියලා දැක්ක.

කවදාකවත් ගහක් තවත් ගහකට පෝර දාන්නේ නෑ. කවදාකවත්ම ගහක් ගිහිල්ලා ගලකට උදව් කරන්නේ නෑ. පර්වතයක් ගිහිල්ලා ගහකට විශේෂ උදව්වක් උපකාරයක් කරන්නේ නෑ. මේ කියන්නාවූ ධර්ම මනසක් තිබෙන්නා වූ හිතක් තිබෙන්නා වූ තැනක පිහිටන ධර්ම. එක කැලේ ගස් ගල් පර්වත පැළෑටි වතුර තිබුණාට ඔවුනොවුන් එකට මිත්‍ර වීමක් සම්බන්ධ වීමක් එකට ගනුදෙනු කිරීමක් නෑ. අපිට පිටින් ඉඳගෙන හිතන්න පුළුවන් මේ කැළේ ඔක්කොම ගනුදෙනු කිරීමක් තිබෙනවා කියලා. නමුත් නාම ධර්ම වගේ ගනුදෙනු කරන්නේ නෑ. මේ කියන්නා වූ ප්‍රකෘති වශයෙන් පිහිටන මේ ධර්ම නාම කියන්නා වූ චිත්ත චෛතසික ධර්ම ක්‍රියාත්මක වෙන තැනක පිහිටන ධර්ම. ඒක නිසා ලෝකයේ ගොඩක් හැදෙනවා භෞතික වස්තු. වලාකුළු හැදෙනවා නැති වෙනවා. ගස් කොළං හැදෙනවා නැතිවෙනවා. ඒවගේම වෘක්ෂ හැදෙනවා නැතිවෙනවා. ගල් පර්වත හැදෙනවා නැති වෙනවා. ගින්දර ඇතිවෙනවා නැතිවෙනවා. මීදුම ඇතිවෙනවා නැතිවෙනවා නමුත් මේවා ඇතිවෙනවාට නැති වෙනවාට වඩා හිතක් තිබෙන සත්වයකුගේ ශරීරයක් හැදෙනවා නැති වෙනවා. නමුත් ඒ ශරීර අනිත් ගස් ගල් පර්වත වගේ නොවෙයි. මේ ශරීර හදන මේ අතපය හදන හිසක් ඇස් දෙකක් හදන හේතු හරි අමුතුයි. මහා බලවත්. ඒවාට මහා අමුතුම විදියේ හේතු තිබෙන්නේ. ඒවා විස්තර කරන්න බැරි තරමට සියුම් වෙච්ච දේවල්. ඒක නිසා මේ නාම ධර්ම කියන ඒවා

පුදුම බල. පුදුම ආනුභාවයක් තිබෙන ප්‍රත්‍යය වෙන ධර්ම සමුදායක්. මේ ප්‍රත්‍යය ධර්ම තවත් එවැනිම ධර්ම කොටසකට ප්‍රත්‍යය උප්පන්න වශයෙන් නැගී හිටින්න ගැම්මක් අල්ලලා දෙන ධර්ම. බුදුරාජාණන් වහන්සේගේ පිරිසිදු නුවණින් බුදුරාජාණන් වහන්සේගේ පිරිසිදු ඥානයෙන් මෙන්න මේ නොපෙනෙන නමුත් තිබෙන ඉරි ගහලා පෙන්නන්න බැරි නමුත් ඉරි වලටත් වඩා බලවත්ව පිහිටන මතුවෙන නාම ධර්ම වල තිබෙන ඇතිවීම නැතිවීම, ඇති උනහම තවත් එකකට උපකාරවෙන විදිය, ඒ උපකාරය ලබාගෙන දෙයක් පහළ වෙන හැටි, ඊළඟට ළඟ වශයෙන් දෙයක් උපකාර වෙන විදිය, දුර වශයෙන් දෙයක් උපකාර වෙන විදිය, ළඟ උපකාරය ලබාගෙන යමක් ප්‍රත්‍යය උප්පන්නයක් හැටියට පහළ වෙන විදිය, දුර තිබෙන දෙයක් උපකාර කරගෙන ප්‍රත්‍යය උප්පන්නයක් හැටියට පහළ වෙන විදිය මේ සියල්ලක්ම බුදුරාජාණන් වහන්සේ මහා ධර්ම සාගරයකට බැහැලා පැහැදිලිව අවබෝධ කර ගත්තා. ඒ අවබෝධ කරගත්ත මහා සාගරයක් වගේ තිබෙන ප්‍රත්‍යය, ප්‍රත්‍යය උප්පන්න ධර්ම කාණ්ඩයේ එන බලවත්වූ ප්‍රත්‍යයක් ප්‍රකෘතියක් හැටියට තමන්ගේ ළඟම තිබෙන දෙයක් බලවත් වූ ප්‍රත්‍යයක් හැටියට උපකාර වෙනවා. ඒ ප්‍රකෘති උපනිස්සය ප්‍රත්‍යය තමයි මම මේ වෙලාවේදී මේ පින්වතුන්ට මතක් කළේ. ඒක නිසා මේ ටික තේරුම් අරගෙන මේ ටික වටහාගෙන තමන්ගේ ජීවිතියට සම්බන්ධ කරලා ප්‍රකෘති උපනිශ්‍රය ධර්ම ප්‍රත්‍යය හැටියට වැඩ කරන ආකාරය තමන්ගේ ජීවිතියේ කොටස් වලින් හොඳට තේරුම් අරගෙන සැමදෙනාටම ප්‍රත්‍යය, ප්‍රත්‍යය උප්පන්න ධර්මතාවයන් නැති ඒවාගෙන් විනිර්මුක්ත උනා වූ සදා කාලික සැප ඇති ශාන්ත සැප ඇති ප්‍රත්‍යය ධර්ම නැති ප්‍රත්‍යය උප්පන්න ධර්ම ඕලාරික වශයෙන් කිසි ආකාරයකින් නැති ආරම්මණ ප්‍රත්‍යය පමණක් ඇති හේතු ඵල ධර්මයන්ට ගොදුරු වෙන්නේ නැති නිවනින් සැනසෙන්න ලැබේවා! කියලා මම මෛත්‍රීයෙන් ප්‍රාර්ථනා කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - බොහොම පිං ස්වාමීන්වහන්ස අපිට කරපු ධර්ම විස්තරයට. ස්වාමීන්වහන්ස අවසානයේදී ඔබ වහන්සේ අපිට විස්තර කරලා දීපු හැටියට සද්ධා සීල සුත චාග පඤ්ඤා කියන ඒ ධර්ම කොටස් සද්ධාව නිසා දුක් මහන්සි වෙනවා කියනකොට අපිට මතක් වෙනවා වයසක කට්ටියත් ශ්‍රී පාදය වන්දනා කරගන්න යනවා. ඒ වගේ කායික දුකකට පත්වෙන අවස්ථාවල් තිබෙනවා. ඒ වගේ සිල් ගන්න ඈත පළාත් වලට යනවා. ඒ වගේ කායිකව වෙහෙසක් ගන්නවා සිල් රකින්න. ඒවගේම භාවනා කරන්න ගියහමත් එක තැනක වාඩිවෙලා ඉන්නකොට දණිස් අමාරු කොන්දේ අමාරු වගේ කායික දුක්ඛයන්ට ගොදුරු වෙනවා. එතකොට එතැනදී දුක කියලා කියන්නේ අව්‍යාකෘත විපාක ධර්මයක්.

ඒවගේම ස්වාමීන්වහන්ස සිත දියුණු කරගත්තම ධ්‍යාන ආදී වඩන්න මහන්සියක් ගන්න වෙනවා. එතැනදිත් කායික දුක්ඛයක් විඳින්න වෙනවා. ඒ වගේම ධ්‍යාන සමාපත්ති ඵල සමාපත්ති වගේ දේවල් වගේ දේවලුත් එනවද ස්වාමීන්වහන්ස මේ අබ්‍යාකත කියන කොටසට? පොඩ්ඩක් පැහැදිලි කරලා දෙන්න. තෙරුවන් සරණයි!

<u>පිළිතුර</u> - එහෙම ධර්ම ඇතිවෙනවා. ඒ කියන්නේ ප්‍රකෘති ස්වභාවයෙන් පහළ වෙන ධර්ම ස්වභාවය නිසා ප්‍රත්‍යය උප්පන්න ධර්මය කුසලයක් වෙනවා ප්‍රත්‍යය උප්පන්න ධර්මය

අව්‍යාකෘතයත් වෙනවා. අව්‍යාකෘත කියලා කියනකොට අපිට තිබෙනවා මෙහෙම ධර්මතා කීපයක්. ඒ තමයි විපාක අව්‍යාකෘතය, ක්‍රියා අව්‍යාකෘත, රූපමය අව්‍යාකෘතය, නිර්වාණ අව්‍යාකෘතය. එතකොට ඔය මහත්තයා කියපු හැටියට අපි රූපයක් බලනකොට ඒ රූපය බලන්නා වූ චක්ඛු විඤ්ඤාණය තමයි පහළ වෙන්නේ. ඒ රූපය බලන්නා වූ චක්ඛු විඤ්ඤාණය විපාක අව්‍යාකෘතයක්. ඒ විපාක අව්‍යාකෘතය ඇති කිරීමට ඉස්සරවෙලා සද්ධාවෙන් කරපු වැඩක්, ඒවාගේම එතැන විපාක ගතියත් උපනිශ්‍රය බලයත් තිබෙනවා. ඊළඟට සුතවත් ගතිය අව්‍යාකෘතයක් ඇති කරන්න මුල් වෙනවා. එතැනදී විපාකය අව්‍යාකෘත වෙනවා. අනිත් එක තමයි මාර්ග සිත් නිසා ඵල සිත් පහළ වෙනවා.

සද්ධාව මුල් වෙලා මේ විදියට වෙනවා. සෝවාන් වෙච්ච කෙනෙක් ඉන්නවා. සෝවාන් ඵලයට පත්වෙච්ච කෙනාට හරි ශ්‍රද්ධාවක් තිබෙනවා නිර්වාණ ශාන්තිය කෙරෙහි. ඒක තණ්හාව නොවෙයි පැහැදීම. ඒ ශ්‍රද්ධාව නිසා ඔහුට හිතෙනවා පොඩ්ඩක් අතුපතු ගාල මේ ටික සකස් කරගෙන විවේකයක් ලබාගෙන සමාපත්තියට සම වදිනවා කියලා. ඔහු සමාපත්තියට සමවදිනකොට නිර්වාණය අරමුණු කිරීම් වශයෙන් අව්‍යාකෘතයකට යනවා. නමුත් රහතන්වහන්සේ එහෙම නොවෙයි. රහතන්වහන්සේ සමාපත්තියට සමවදිනකොට සමාපත්ති වශයෙන් රහතන්වහන්සේට පහළ වෙන්නේ ක්‍රියා ධර්මයි. ඒක නිසා එතැනදී ක්‍රියා සිත් පහළ වෙනවා. අරමුණු කිරීම් වශයෙන් තමයි මුලින් ඉන්නා වූ ආර්යන් වහන්සේලා තුන්දෙනාටම අව්‍යාකෘතය හැදෙන්නේ. නාම ධර්ම මතු කිරීම වශයෙන් රහතන්වහන්සේට ක්‍රියා අව්‍යාකෘතය පහළ වෙනවා.

ඔය විදියට කුසල වශයෙන් ප්‍රත්‍යය උප්පන්න ධර්මයන් පහළ වෙන්නත් අකුසල වශයෙන් දිට්ඨි ගත වීම මාන්නය හැදීම රාගය ඇතිවීම තරහ යෑම වගේ අකුසල වශයෙන් ධර්ම මතුවෙන්නත් උපනිශ්‍රය ධර්ම ප්‍රත්‍යය වෙනවා. දැන් මේ කියපු හැටියට විපාක අව්‍යාකෘත වශයෙන් ධර්ම පහළ වෙන්නත් උපකාර වෙනවා සද්ධාදී ධර්ම. දැන් මේ පින්වතුන්ට තේරෙනවා ඇති මේ කුසල ගතිය අකුසල ගතිය අව්‍යාකෘත ගතිය කොච්චර තැන් වල තිබෙනවද කියලා. හේතුව අපි තික මාතිකාව දැන ගත්ත හින්දා මේ පින්වතුන්ටත් අපි කොයි කාටත් මේක හසුරුවගන්න පුළුවන්. තව ගොඩක් තිබෙනවා තික මාතිකාව හසුරුවන්න. ඔය විදියට තමයි ඕක සිද්ධ වෙන්නේ කියලා මම මෛත්‍රීයෙන් මතක් කරනවා. තව ඉතින් විස්තර අහන එක බලන එක කියවන එක සාකච්ඡා කරන එක හැම කෙනාටම වටිනවා. තෙරුවන් සරණයි!

<u>ප්‍රශ්නය</u> - තෙරුවන් සරණයි ස්වාමීන්වහන්ස එතැනදී සද්ධාව නිසා කායික වශයෙන් දුකක් විඳිනවා කියන එක එතකොට ඒක සද්ධාවේ විපාකයක් නොවෙයි කියන එක නේද අපි එතැනදී තේරුම් ගන්න ඕනෑ ස්වාමීන්වහන්ස? සද්ධාව එතැනදී ප්‍රකෘති උපනිස්සය ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය උනාට ඒක සද්ධාවේ විපාකයක් නොවෙයි නේද ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - සද්ධාවේ ළඟ එකක් නොවෙයි නමුත් ඒ සද්ධාව කරන්නේ ඉස්සරවෙලා වෙන තැනක සිද්ධ කරපු දේක විපාකයක් උලුප්පවලා දෙන්න හේතුවෙන එකක්. ඒක

අහේතුක කාරණයක්. කායික දුක්ඛය කියන එක අහේතුක දුක් විපාකයක්. ඒක විපාක ස්වභාවයක්. හැබැයි මෙතැනදී අපි හිතමු වන්දනාවක යනවා, වන්දනාවේ යන්නේ සද්ධාවෙන්. එහෙම සද්ධාවෙන් යනකොට වෙන තිබෙන්නා වූ පරණ අකුසල විපාක සම්බන්ධ වෙලා එන්න පුළුවන්. සද්ධාවෙන් ඒ දේවල් කරන්න ගිය හින්දා තමයි ඒවා ආවේ. ආන්න එතකොට වෙන එහෙක ඇඳ ගත්ත විපාකයක් ඉස්සරහට දෙනවා. තවත් එකක් තමයි ඉස්සෙල්ලා කරපු දේක විපාකය එන කොට විපාක ගතියත් තිබෙනවා සද්ධාවේ උපනිශ්‍රය ගතියත් තිබෙනවා. ඒවගේ එක ධර්මයක් පහළ වෙන්නේ බහු හේතු ගතියක් එක්කයි. එක හේතුවකින්ම එන්නේ නෑ. ඉතින් අපි මේකට සම්බන්ධ කරලා අද කථා කරන්නේ උපනිශ්‍රය ප්‍රත්‍යයයේ ගැම්ම අරගෙන පහළ වෙන ප්‍රත්‍යය උප්පන්න ධර්ම අල්ලලා. හැබැයි ප්‍රත්‍යය උප්පන්නයක් දිග හරියට පස්සේ හරියට අර මේසයක කකුල් හතර වගේ. එක වේලාවේ මේසයේ කකුල් හතර තට්ටුවට පිහිටන්න උපකාර වෙනවා වගේ එක ධර්මයකට විපාක වශයෙන්, උපනිශ්‍රය වශයෙන්, නිශ්‍රය වශයෙන්, හේතු වශයෙන් උදව් වෙනවා උපකාර වෙනවා. ඒකට කියනවා ප්‍රත්‍යය ගණනය කරනවා කියලා = ප්‍රත්‍යය ගණනාව. පෙරහැර වගේ එක දිගට ප්‍රත්‍යය කීයක් තියෙනවද කියලා බලන එකට කියනවා ප්‍රත්‍යය ගණනය කරනවා කියලා. ඒක ඉස්සරහ පාඩමකදී දැනගන්න පුළුවන්. ඔය විදියට හිතා ගත්තොත් හොඳයි. තෙරුවන් සරණයි!

<u>Bruno මහත්මයා</u> - තේරුණා ස්වාමීන්වහන්ස අපිට ගොඩක් වේලාවට ඇහෙන දෙයක් තමයි භාවනා කරන්න ගියහම තමයි මේ ප්‍රශ්න එන්නේ කියන එක. භාවනා කරන්නේ නැත්නම් ඕක නැහැ කියන එක. හුගක් අයට තේරුම් ගන්න බැරි එකක් තමයි ඒක භාවනා කරන්න තිබෙන ශ්‍රද්ධාව නිසා එන එකක් නොවෙයි බව.

අනිත් ප්‍රශ්නය තමයි ස්වාමීන්වහන්ස ආනන්තරිය පාප කර්මයක් කළොත් නියත වශයෙන්ම අපාගත වෙනවා කියල තිබෙනවා. එතකොට ඒක ප්‍රකෘති උපනිශ්‍රය ප්‍රත්‍යයෙන් වෙන දෙයක්ද? කුසල පැත්තෙනුත් ඒවගේ තිබෙනවා කියනවා සෝවාන් උනහම. එතකොට එතනත් ප්‍රකෘති වශයෙන් උපනිශ්‍රය වෙන එකක්ද තිබෙන්නේ නැත්නම් වෙන එකක්ද තිබෙන්නේ ස්වාමීන්වහන්ස?

<u>පිළිතුර</u> - උපනිශ්‍රය ප්‍රත්‍යය නැත්තේත් නෑ. උපනිශ්‍රය ප්‍රත්‍යය තිබෙනවා ආකාර තුනකට. එකක් ආරම්මණ වශයෙන් උපනිශ්‍රය වෙනවා, ප්‍රකෘති වශයෙන් උපනිශ්‍රය වෙනවා, අනන්තර උපනිශ්‍රයත් තියෙනවා. කෙනෙක් ආනන්තරිය කර්මය කළාට පස්සේ එයා ඒ කාන්තයෙන්ම දුගතියට පත් වෙන්නේ එයා ඒකෙන් හදාගන්නවා කර්ම නිමිත්තක්. ඕක තමයි වරදින තැන. ඒ කර්ම නිමිත්ත අයින් කරන්න බෑ. හරියටම ඒ වෙලාවට බලවත් ලෙස එන කර්ම නිමිත්තක් ඒක. ඒ කර්ම නිමිත්ත ආපු ගමන් එයා වෙන පැත්තකට ඒක හරවන්න බෑ. ඒක නිසා මවු මැරීම පියා මැරීම ආදී දේවල් ආනන්තරිය වෙන්න හේතුවත් ගුණ වශයෙන් අම්මා, ගුණ වශයෙන් තාත්තා, ගුණ වශයෙන් බුදුන්, ගුණ වශයෙන් රහතන්වහන්සේ, ඒවගේම සංඝයා ගත්තහම ජීවිතයකට අම්මයි තාත්තයි හරි ළඟයි. අපි අහලා තිබෙනවා නේද මනුස්සයෙක් වයසට යනකොට එයාගේ ජීවිතේ මැද කාලේ කරුණු අමතක වෙනවා. පොඩි කාලේ දේවල් මතක් වෙනවා කියලා. පොඩි

කාලේ දේවල් මතක් වෙනකොට අම්මා තාත්තා සහෝදරයෝ ගම් පළාත් ආදිය මතක් වෙනවා. එහෙම ගොඩක් වෙන්නේ ඒවා එයාගේ ජීවිතියට සම්බන්ධ සහ ඒවායේ ගුණ නිසා.

බුදුරාජාණන් වහන්සේ සහ රහතන්වහන්සේ විශේෂයෙන්ම අපේ ජීවිතියට සම්බන්ධ උනේ නැතත් ගුණ වශයෙන් හරි වැඩියි. ආන්න ඒක නිසා ඒ කරන ක්‍රියාව තුල කවදාකවත්ම එයාට අර අවසාන අවස්ථාවේදී ඒ නිර්මාණය වෙන කර්ම නිමිත්ත යට කරන්න බෑ. අනිවාර්යෙන්ම අපායේ යනවා. ඒකයි ඒකට ආනන්තරිය කියලා කියන්නේ. මෙතැනින් චුත වෙන්න කලින් බලවත් අරමුණක් හදලා දෙනවා.

නමුත් මෙහෙම එකකුත් තිබෙනවා. අජාසත්ත රජතුමා අපායේ ගියා. එයා අපායේ ගියේ තාත්තා මරපු නිසා. එයා මහා නරකාදියට යන්න හිටපු එක ඔසුපත් නිරයකට යන්න පුළුවන් උනා පස්සේ කාලයකදී තමන් කරපු දේවල් තේරුම් අරගෙන බුද්ධ සාසනේ භික්ෂූන් වහන්සේලාට බොහෝම ලංව හිතවත්ව හරි ආදරෙන් මෛත්‍රීයෙන් කරුණාවෙන් කටයුතු කරපු නිසා. බුදුරාජාණන් වහන්සේගේ ධර්මය පළවෙනියට සජ්ඣායනා කරනකොට ඒ ධර්මය සජ්ඣායනා කළ 500 ක් රහතන් වහන්සේලාට දාන මාන දුන්නේ තාත්තා මරාපු කෙනෙක්. ඒවගේ දේවල් වලින් තමයි අර පාපය අඩු කරගත්තේ. එහෙම දේවල් තිබෙනවා.

ඊළඟට සෝවාන් වෙච්චි එක්කෙනා සිත් ගණනාවක් නසනවා. ඒ කියන්නේ අකුසල ධර්මයන්ගේ තිබෙන දිට්ඨිගත සම්ප්‍රයුක්ත සිත් ඔක්කොම එයා නසනවා. උපේක්ෂා සහගත දෙකයි සෝමනස්ස සහගත දෙකයි. ඒ දිට්ඨිගත සිත් සහ විචිකිච්ඡා සහගත සිතත් නැති කරනවා. එතකොට සිත් 12 කින් තව තිබෙන්නේ සිත් කීපයයි. ඒ ටික නැති කරහම එයාට ඒ නිසා ඇති වෙන්නා වූ දෘෂ්ඨිගත නිමිති පහළ වෙන්නෙත් නෑ ධර්මයක් හැටියට, ධර්ම ස්වභාවයෙන්ම එයාට නිවන් අරමුණු කරගෙන පහළ වෙච්ච සහ කර්මය කර්ම ඵලය විස්වාස කරගෙන කරපු හොඳ කුසල ධර්මයෝ අවසාන කාලේදී හිතට පුදුම විදියට ගලාගෙන යනවා. ඒක අනිවාර්යෙන්ම සිද්ධ වෙනවා. ඒක නිසා මනුස්ස ලෝකයේ උපදින්නත් පුළුවන් දිව්‍යලෝකයේ උපදින්නත් පුළුවන්.

කවදාකවත් කෙනෙක් නිවන් අරමුණු කරගෙන ඵල සිත් වලින් උපදින්නේ නෑ. කාමාවචර කුසල් සිතක් තමයි ඉදිරිපත් වෙන්නේ. ධ්‍යාන භාවනා කරලා තිබුණොත් මරණාසන්න අවස්ථාවේදී ධ්‍යාන ආරම්මණය ඉදිරිපත් වෙනවා. ඔය විදියට තමයි ඕක සිද්ධ වෙන්නේ. තෙරුවන් සරණයි!

<u>ජයන්ත මහත්මයා</u> - ස්වාමීන්වහන්ස ඔබ වහන්සේ අපි වෙනුවෙන් කාලය වෙහෙස නොබලා මධ්‍යම රාත්‍රිය කිට්ටුවෙනකම්ම අපිට ධර්මය කියලා දීම පිළිබඳව අපේ ඉතාම කෘතවේදී පුණ්‍යානුමෝදනාව සවනට සිසිලස වෙනුවෙන් ඔබ වහන්සේට පිරිනමනවා. මම ඉතාම ගෞරවයෙන් ඔබ වහන්සේට යොමුවෙනවා අද සාකච්ඡාව නිමා කරන ලෙස ස්වාමීන්වහන්ස තෙරුවන් සරණයි!

ස්වාමීන්වහන්සේ - සැමදෙනාටම තෙරුවන් සරණයි! ශ්‍රද්ධාවන්ත පිංවත්නි. අදත් අපි මේ කාල වෙලාව අරගෙන බුදුරාජාණන්වහන්සේගේ ගාම්භීර ධර්ම පරාසයක හිත මෙහෙය වන්න උත්සහ කළා. අභිධර්මයේ ප්‍රත්‍යය කොට්ඨාස කථා කිරීම හරි ගැඹුරුයි. ඒ ගැඹුරු ධර්ම එක පුංචි ධර්මයක් තවත් ධර්මයක ස්පර්ශ වෙනවා වගේ ස්වභාවයක් මේකේ තිබෙන්නේ. ඉතින් ඒ ධර්ම මෙනෙහි කරන්න මෙනෙහි කරන්න අපිට පුද්ගල සංඥාව නැති වෙනවා වගේම බුදුරාජාණන්වහන්සේගේ නුවණේ තිබෙන්නා වූ විසිතුරු කම කියන ධර්මය මතුවෙනවා. උන්වහන්සේ මේවා ප්‍රකාශ කළේ නැත්නම් සැරියුත් මහා රහතන්වහන්සේ විස්තර කරලා තුබුණේ නැතනම් අපිට මේ ධර්මය තේරුම් ගන්න හිතන්න මෙනෙහි කරන්න අවස්ථාව සැලසෙන්නේ නෑ. ඉතින් අදත් මේ පින්වත් සියලු දෙනාම මේ වැඩ සටහනට සම්බන්ධ වෙලා මහා විසාල කුසල් සිත් පරම්පරාවක් උපදවා ගත්තා බණ ඇසීම් සාකච්ඡා කිරීම් වශයෙන්. මේ උපදවා ගත්තා වූ සියලු කුසල ධර්මයන්ගේ බලයෙන් ශක්තියෙන් පින්වත් මේ ධර්ම මණ්ඩලයේ ඉන්න සැම දෙනාටමත් ශාන්තියක් වේවා! විශේෂයෙන්ම අපේ ලලිත් දළුවත්ත මහත්මයාට ඒ පවුලේ සැමදෙනාටම ඒවාගේම මෙහෙය වීම් කටයුතු සිද්ධ කළාවූ ජයන්ත මහත්මයාට ඒ වාගේම ප්‍රශ්න ඇසූ අපේ Bruno මහත්මයාට අනිත් අසාගෙන සිටිය මහත්ම මහත්මීන් සැම දෙනාටම ධර්මඥානය භාවනාඥානය පහළ වේවා! මේ ධර්මය අසන සැම වාරයක් පාසාම සැම අවස්ථාවකදීම කෙලෙස් ගිනි නිවාගෙන මනසිකාරය මතු කරගෙන අපි මේ මතුකරලා දීපු ශ්‍රද්ධාදී ගුණ ධර්ම දියුණු කරගෙන ධර්මයන් මෝරවාගෙන ප්‍රඥාව වඩවාගෙන ප්‍රඥාවෙන් බුද්ධාදී උත්තමයන් අවබෝධ කරගත්ත සදාකාලික සැප ඇති නිවනින් සැනසෙන්න ලැබේවා! නිර්වාණ අවබෝධය පිණිස නිර්වාණය ස්පර්ශ කිරීම පිණිස මේ බණ ඇසීමේ මෙනෙහි කිරීමේ කුසලය හේතු වේවා! වාසනා වේවා! කියලා මෛත්‍රීයෙන් ආශ්‍ර්වාද කරනවා. සැම දෙනාටම තෙරුවන් සරණයි!

සාධු! සාධු! සාධු!

සීලවන්තං ගුණවන්තං - පුඤ්ඤක්ඛෙත්තං අනුත්තරං
දුල්ලබෙන මයා ලද්ධං - පස්සිතුං වන්දිතුං වරං
සාරිපුත්තාදි ථේරානං - ආගතං පටිපටිය
සද්ධා සීලං දයා වාසං - බුද්ධ පුත්තං නමා මහං



ඉහත සඳහන් ධර්ම දේශනාව

අති පූජ්‍ය හන්තේ ජිනාලංකාර ස්වාමීන්වහන්සේ විසින් දේශිතයි.